# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,509 — 1965 සැප්තැම්බර් 18 වැනි සෙනසුරාදා — 1965.9.18**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ප්‍රකාශන ආදිය

අ. ආ. කා. අංක එන්. 107/65.

**ශ්‍රී ලංකාද්වීපයේ හා තදීය යටත් දේශයන්ගේ අග්‍රාණ්ඩුකාර හා සේනාධිනායක ධූරීන, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අති උත්තම පටිපාටියෙහි සාමාජිකයකු වූ විලියම් ගොපල්ලව උතුමාණන් වහන්සේ විසිනි.**

මුද්‍රාව

ඩබ්ලිව්. ගොපල්ලව

අබ්දුර්රහමන් සෙයියඩ් අහමඩ් මහත්මයා වෙතය.

ශුභාශිංශන පෙරටුවයි :

ලංකාවෙහි ගුවන් විදුලි ප්‍රචාරයේ සහ ප්‍රවෘත්තිවල තත්ත්වය ද ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පරිපාලනය, සංවිධානය සහ ක්‍රියාකාරී ක්‍රම සම්බන්ධයෙන් ද සොයා බලා වාර්තා කිරීමේ කාර්යය සඳහා දිවයිනේ පොදු මුද්‍රාව යටතේ නිකුත් කරනු ලැබ, 1965 ජූලි මස තිස්එක් වෙනි දින අංක 14,468 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද 1965 ජූලි මස 31 වෙනි දින දරන බලපත්‍රය මගින් කොමිෂන් සභාවක් පත් කරනු ලැබූ හෙයින් ද ;

ඉහත කී කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරන ලද ඇම්.බී.ඊ. නාමධාරී, හමීඩ් හුසේන් ෂෙයික් ඉස්මයිල් මහත්මයා එකී කොමිෂන් සභාවෙන් ඉල්ලා අස්වී ඇති හෙයින් ද ;

ඉහත කී සාමාජිකයා වෙනුවෙන් වෙනත් සාමාජිකයකු පත් කිරීම අවශ්‍ය හෙයින්ද ;

(393 වෙනි අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 වෙනි, 3 වෙනි හා 5 වෙනි වගන්තිවල විධිවිධාන අනුව, අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව වන මම ඉහත කී අබ්දුර්රහමන් සෙයියඩ් අහමඩ් මහත්මයා වන ඔබ එකී කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීමෙන් ඉහත කී බල පත්‍රය මෙයින් වෙනස් කරමි.

වර්ෂ 1965 ක්වූ සැප්තැම්බර් මස දහසය වෙනි දින වූ මෙදින මෙම දිවයිනේ මුද්‍රාව යටතේ කොළඹ දී ප්‍රදානය කරන ලදී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

9–940

---

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1965 අංක 357**

අ. ආ. කා. අංකය : සී. 162/49 (5).

මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් හා භාණ්ඩාගාරයේ ලේකම්, ඇම්.බී.ඊ., නාමධාරී, එච්. ජිනදාස සමරක්කොඩි මහතා දිවයිනට පෙරළා පැමිණෙනතුරු, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 51 වැනි වගන්තිය යටතේ, ජනසතු සේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ඇම්. රාජේන්ද්‍ර මහතා 1965 සැප්තැම්බර 16 වැනි දින සිට තම රාජකාරිවලට අමතරව, මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් හා භාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් වැඩ බැලීමට පත් කළ බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 සැප්තැම්බර 15 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

9–939

ඇල්. ඩී.—බී. 36/57.

# ආණ්ඩුවේ නිවේදන

## 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත

### 33 වැනි වගන්තිය යටතේ ආඥාව

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ 33 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ඇමති, දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, ඉහතකී පණතේ 2 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1959 ජනවාරි 1 වැනි දින අංක 11,632 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නීතිගත කිරීමේ ආඥාවෙන් පිහිටුවන ලද නීතිගත සංස්ථාවක් වූ ලංකා සම්භාණ්ඩ නීතිගත සංස්ථාවේ කාර්‍යයන් සඳහා මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව මේ ආඥාවෙන් අනුමත කරමි.

1965 ක්වූ සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ඇමති.

### උපලේඛනය

| බිම් අංකය | ඉඩමේ නම සහ හිමිකම් කියන තැනැත්තාගේ නම සහ ලිපිනය | ප්‍රමාණය අ. රූ. ප. | මායිම් | පිහිටීම |
|---|---|---|---|---|
| 1 ... | තක්සේරු අංක 115, කැළණිගඟ මෝල පාර, මට්ටක්කුලිය, කොළඹ 15. කොළඹ 5, ඩෝසන් පාරේ, අංක 4හි, එඩිත් ඩොරතියා කොරයා මහත්මිය විසින් හිමිකම් කියනු ලැබේ. | 0 2 6 ... | වයඹ : කොළඹ 15, කැළණිගඟ මෝල පාරේ, අංක 99/1 න්ද, ඊසාන : කොළඹ 15, කැළණිගඟ මෝල පාරේ, අංක 115/1ඒ ද, ගිනිකොණ : කොළඹ 15, කැළණිගඟ මෝල පාරේ, අංක 115/1 ද, නිරිත : කොළඹ 15, කැළණිගඟ මෝල පාරද වේ. | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙහි. |
| 2 ... | තක්සේරු අංක 116, කැළණිගඟ මෝල පාර, මට්ටක්කුලිය, කොළඹ 15. කොළඹ 5, ඩෝසන් පාරේ අංක 4හි, එඩිත් ඩොරතියා කොරයා මහත්මිය විසින් හිමිකම් කියනු ලැබේ. | 1 2 20 ... | වයඹ : කොළඹ 15, කැළණිගඟ මෝල පාරේ, අංක 70 ද, ඊසාන : කොළඹ 15, කැළණිගඟ මෝල පාර, ගිනිකොණ : කොළඹ 15, කැළණිගඟ මෝල පාර, අංක 115/1 ද, නිරිත : කොළඹ 15, ශාන්ත මරියා මාවතේ, අංක 51, 75 සහ 85 ද වේ. | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙහි. |
| 3 ... | තක්සේරු අංක 118, කැළණිගඟ මෝල පාර, මට්ටක්කුලිය, කොළඹ 15. කොළඹ 5, ඩෝසන් පාරේ අංක 4හි, එඩිත් ඩොරතියා කොරයා මහත්මිය විසින් හිමිකම් කියනු ලැබේ. | 0 0 11 ... | වයඹ : කොළඹ 15, කැළණිගඟ මෝල පාරේ, අංක 116 ද, ඊසාන : කොළඹ 15, කැළණිගඟ මෝල පාර, ගිනිකොණ : කොළඹ 15, කැළණිගඟ මෝල පාරේ, අංක 116 ද, නිරිත : කොළඹ 15, කැළණිගඟ මෝල පාරේ, අංක 116 ද වේ. | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙහි. |

9–941

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රේගු නිවේදනය අංක 61/9/199

ආදයම් රක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1965 සැප්තැම්බර් මස 20 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දැක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... ... | 1 04 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... ... | 0 06 |

අංක ඒ. 781.
1965 සැප්තැම්බර් මස 18 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

ග. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

9–985

## රේගු දැන්වීම අංක 64/5/59

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරණ ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 සැප්තැම්බර් මස 20 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 207½ වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 268 85 ... | 250 0 ... | 212 31 ... | 67 21 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

අංක ඒ. 744/22.
1965 සැප්තැම්බර් මස 18 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

ග. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

9–986

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි